
# ලෝකාලෝකය

## 2025 සැප්තැම්බර් - ඔක්තෝම්බර් කලාපය



**බය නොවෙන්න, මක්නිසාද මම නුඹ සමග සිටිමි;**
**තැති නොගන්න, මක්නිසාද මම නුඹේ දෙවියන්වහන්සේය.**
**මම නුඹ ශක්තිමත් කොට, නුඹට උපකාර කරන්නෙමි;**
**එසේය, මාගේ ධර්මිෂ්ඨකම නමැති**
**දකුණතින් නුඹ උසුලන්නෙමි.**
**(යෙසායා 41 : 10)**

ක්‍රිස්තියානි සහෝදර මධ්‍යස්ථානය
අංක - 07, විවේකානන්ද පාර, වැල්ලවත්ත, කොළඹ 06.
දුරකථන අංක : 011 2581901




# අඹ යහළුවන්

පුතේ දුවේ, කොහොමද ඔයාලට පාසල් නිවාඩු කාලය නම් දැන් ඉවරයි නේද? ඊත් ඉතිං අගෝස්තු නිවාඩුව කියන්නේ ඔයාල ආසම කරන නිවාඩු කාලයනේ. මොකද අගෝස්තු මාසයෙ තමයි දරුවනේ ඔයාල ආසම කරන සරුංගල් තරඟ තියෙන්නේ. පාට පාට කොළ අලවපු, එක එක හැඩයේ සරුංගල් ඔයාල ළඟත් තියෙන්න ඇතිනේද?

හොඳයි දුවේ පුතේ නිවාඩු කාලය ඉවර වෙලා ආයෙත් පාසල් යන්න පටන් ගත්ත පුංචි දුවලා පුතාලට අද මම කියන්න යන්නේ පුංචි අවවාදයක් දෙන ලස්සන කතන්දරයක්. එක ගමක හිටියා කමල් සහ පියල් කියලා පුංචි මිතුරන් දෙන්නෙක්. මේ දෙන්නට ගමේ අය කිව්වේ අඹ යාළුවො කියලා. මොකද මේ දෙන්නා ඒ තරම්ම යාළුයි. මේ දෙන්නා තම තමාට තිබුණු දේ හුවමාරු කරගෙන බෙදා හදා ගත්තා.

දවසක් පියල්ට එයාගේ මාමා අඹ පැළ දෙකක් ගෙනත් දුන්නා. පියල් වගා කරන්න හුඟක් කැමති ළමයෙක්. ඉතිං මේ පුංචි පියල් එක අඹ පැළයක් එයාගේ මිදුලේ හිටෙව්වා. ඊකට වතුර දාලා, ලී වලින් වට කරලා කුඩා කොටුවකුත් හැදුවා. අනික් අඹ පැළය එයාගේ පුංචි යාළුවාට ගිහින් දෙන්න පියල් අමතක කළේ නැහැ. මොනවද මේ අඹ ජාතිය? කමල් ඇසුවා. මේ අත්තේ ඇපල් අඹ හැදේවි. මේක බද්ධ කරපු පැළයක් පියල් කීවා. ඉතිං කමල් එයාගේ යාළුවාට ස්තූති කරලා ඒ පැළය සිටුවා වතුර දැම්මා. දිනපතා එය පරිස්සමින් බලා ගත්තා.

අඹ පැළ දෙකම වැඩෙන්නට පටන් ගත්තා. කාලය ක්‍රමයෙන් ගෙවිලා ගියා. කමලුයි පියලුයි දෙන්නත් ටිකෙන් ටික ලොකු වුණා. ඔන්න දවසක් පියල් ඇවිත් මෙහෙම කිව්වා. කමල් අඹ ගසේ වල් අඹ අත්ත කපා දාන්න ඕන. නැත්තම් බද්ධ කරපු අඹ අත්ත නාස්ති වෙන්න පුළුවන්. නෑ....... නෑ........ අපූරුවට මගේ අඹ පැලේ හැදෙනවා. හොඳ අඹ කන්න පුළුවන් වෙයි කියලා කමල් කීවා. තව ටික කාලයක් ගත වුණා.

දවසක් පියල් කුඩා බෑගයක් කමල්ට ගෙනවිත් දුන්නා ඒකේ තිබුණේ හොඳට ඉදුණු ඇපල් අඹ ගෙඩි කිහිපයක්. කමල් රස කර කර ඒ අඹ කෑවා. ඔයා කන අඹ කැඩුවේ මගේ බද්ධ කරපු අඹ ගසෙන් පියල් කිව්වා. කමල්ගේ අඹ ගසෙත් ගෙඩි පිරිලා තිබුණා. ඊත් පියල්ගේ අඹ ගසේ ගෙඩි සෑදී තිබුණේ බොහොම ටිකයි. එක දවසක් කමල් අඹ ගෝනියක් විතර ගෙනත් පියල්ට දීලා හරිම ආඩම්බරයෙන් මෙහෙම කිව්වා. මෙන්න අඹ තවම මම කටේවත් තිබ්බේ නෑ. අපි දෙන්නම එකට කමු. ඉතිං පියල් ඉක්මණට පිහියක් ගෙනාවා. අඹ ගෙඩියක් කපා ගෙන දෙන්නම කන්න පටන් ගත්තා. කාලා දෙන්නම මුහුණට මුහුණ බලාගත්තා. සිදුවෙලා තිබුණේ මොකද්ද කියලා ඔයාලා දන්නවද? කමල් කපා දාලා තියෙන්නේ අඹ පැළේ බද්ධ කරපු අත්ත. සරුවට ගෙඩි ඇවිත් තියෙන්නේ වල් අඹ අත්තේ. ඇඹුල්ම ඇඹුල් අඹ කටේ තියන්න බෑ. මේ වෙලාවේ පියල් මෙහෙම කිව්වා. මගේ අඹ හොඳයි ටිකයි තිබුණේ. ඔයාගේ ගහේ අඹ නරකයි හැබැයි ගොඩක් තිබුණා.

ඉතිං දුවේ පුතේ මේ කතාවෙන් යේසුස්වහන්සේ අපට කියාදුන් වචනයක් සිහිපත් වෙනවා නේද? හොඳ ගස හොඳ ඵල දරයි. නරක ගස නරක ඵල දරයි. **(මතෙව් 7:17-18)**. පුංචි ඔයාලගෙ හිත්වලත් හොඳ ගතිගුණ වර්ධනය වෙන්නට නම් නරක දේවල් පහ කරලා දාන්න ඕන. නැති නම් යහපත් ගතිගුණ යටපත් වෙලා නරක ගති වැඩි වේවි. දුවේ පුතේ දෙවියන්වහන්සේ ඔයාල දිහා බලාගෙන ඉන්නවා. ඒ නිසා හැම වෙලාවෙම යහපත් වැඩ කරන්න, යහපත් වචන කතා කරන්න, උපකාර අවශ්‍ය හැම දෙනාටම උපකාර කරන්න. දෙවිපියාණන්වහන්සේ සතුටු වන ආකාරයට ජීවත් වෙන්න උත්සාහ කරන්න. දෙවියන්වහන්සේ ඔයාල හැම දෙනාටම ආශිර්වාද කරන සේක්වා.

**- තබීතා නැන්දා -**

# ඔබේ බලාපොරොත්තුව කුමක්ද?

විවිධ තරාතිරම් වල සිටින මනුෂ්‍යයන් කීපදෙනෙකුගෙන් ඉහත මාතෘකාවේ දැක්වෙන ප්‍රශ්නය ඇසුවොත් ලැබෙන පිළිතුරුද විවිධාකාර විය හැකිය. එසේ ලැබිය හැකි පිළිතුරු සාමාන්‍යයෙන් මෙසේ විය හැකි නොවේද?

**දේශපාලඥයෙකු** - "මගේ ලොකුම බලාපොරොත්තුව මගේ ආසනයට, රටට හොඳ සේවයක් ලබාදීමයි".

**කලාකරුවකු** - "රටේ දක්ෂම කලාකරුවා වීම මාගේ එකම පැතුමයි".

**ශිෂ්‍යයෙකු** - "ඉහළින්ම විභාගය සමත් වී උසස්ම රැකියාවක් ලබාගැනීම තරම් දෙයක් තවත් මට නැත".

**භාර්යාවක්** - "මගේ උතුම්ම පැතුම මගේ ස්වාමිපුරුෂයා සහ දරුවන්ය. ඔවුන් උසස් වෙනවා දැකීම මගේ බලාපොරොත්තුවයි".

**විද්‍යාඥයෙකු** - "නවතම සොයාගැනීමක් ලෝකය ඉදිරියට ගෙන ඒම මගේ ලොකුම බලාපොරොත්තුවයි".

මේ සෑම පැතුමකම බලාපොරොත්තුව උසස් ගෞරවයක් ලබාගැනීමයි. ඔවුන්ගේ සියලු පැතුම් මෙම තාවකාලික ලෝකයට සීමා වෙයි. එපමණක් නොව මෙමගින් තමාම උසස් කර ගැනීම හා ධනවත් වීමය. මේ සෑම බලාපොරොත්තුවකම ආත්මාර්ථකාමී බව ගැබ්ව ඇත. අද මිනිස් සමාජ තත්වය මෙයාකාරයි.

ඇදහිලිවන්තයන්යකුගෙන් ඉහත කී ප්‍රශ්නය අප ඇසුවොත් ඔහුගේ පිළිතුර කුමක්වෙයිද? ඔහු කුමක් පවසයිද? "මගේ එකම පැතුම ස්වාමී වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේය. උන්වහන්සේගේ දෙවන පැමිණීම, මගේ එකම බලාපොරොත්තුවයි". සෑම ඇදහිලිවන්තයෙකුටම මෙම එකම පිළිතුර දිය හැකි වෙයිද?

## සූදානම් වන්න

යේසුස්වහන්සේගේ දෙවන පැමිණීම ඉතාම සමීප බව ඒ සම්බන්ධව ලකුණු ඉටුවේගෙන යෑම තුළින් පෙනේ. එබැවින් ඒ සඳහා හැම විටම අප සූදානම්ව සිටීම ඉතාම අවශ්‍යව තිබේ. "අප නුඹලාට ප්‍රේම කරන්නාක් මෙන්ම ස්වාමීන්වහන්සේ නුඹලාගෙන් එකිනෙකා කෙරෙහිත්, අනික් සියල්ලන් කෙරෙහිත් නුඹලාගේ ප්‍රේමය වැඩිකර එයින් නුඹලා පුරවා මෙසේ අපගේ ස්වාමී වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තමන්ගේ සියලු ශුද්ධවන්තයින් සමඟ එන කල නුඹලාගේ සිත් අපගේ පිය වූ දෙවියන්වහන්සේ ඉදිරියෙහි ශුද්ධකමින් නිදොස්ව තිබෙන්නට ස්ථිර කරන සේක්වා" (**1තෙසලෝනික 3:12-13**).

යේසුස්වහන්සේ අප නොසිතන වේලාවක එන බැවින්, මේ දේව වචනය අනුව අපගේ සිත් ප්‍රේමයෙන් පුරවාගත යුතුව ඇත. එසේම අපේ සිත් ශුද්ධව, නිදොස්ව, ස්ථිරව තබා ගත යුතුව ඇත. උදාසීනව නොසිට වහාම උන්වහන්සේව සම්මුඛ වීමට සූදානම් වන්න. ඒ සඳහා උන්වහන්සේ අප සියල්ලන්ටම උපකාර කරන සේක්වා.

- සංස්කාරක -

**එස්. මෙත්තානන්ද**

**077 8813197**

# යේසුස්වහන්සේගේ යාච්ඤාව

**(කරුණාකර මෙම ලිපිය කියවන්නට පෙර යොහාන් 17 පරිච්ජේදය ඔබගේ බයිබලයෙන් කියවන්න)**



යොහාන් ශුභාරංචි පොතේ දහ හත්වන පරිච්ජේදය පුරා විහිදී යන යේසුස්වහන්සේගේ යාච්ඤාව කියවා බලන්න. අපට එම යාච්ඤාවෙන් ඉගෙන ගත හැකි ආත්මික පාඩම් බොහෝය.

**"යේසුස්වහන්සේ මේ දේවල් කියා ස්වර්ගය දෙසට ඇස් ඔසවා..."** යනුවෙන් පරිච්ජේදය ආරම්භ වේ. උන්වහන්සේ සිය ගෝලයන් අමතා කී අනුශාසනා වාක්‍යවලින් පසුව ඊළගට පිවිසෙන්නේ යාච්ඤාවටයි. ඉගැන්වීම, අනුශාසනයට ඉතාම හොඳ දෙයකි. නමුත් එය සම්පූර්ණවන්නේ තමන්ගෙන් ඉගෙන ගත් හෙවත් දේව වචනය ඇසූ අය උදෙසා යාච්ඤා කිරීමෙන්ය. අපෙන් දේව වචනය ලැබූ අය එම වචනය ඵල දරණ පිණිස අපි ස්වර්ගය දෙසට ඇස් ඔසවා යාච්ඤා කරමු.


## සේවයක් හා දීමනාවක්

**"ඔබ මට කරන්ට දුන් වැඩ මම තීන්දු කර පොළවේ දී ඔබ ගෞරවයට පැමිණුවෙමි" (4වන පදය)** ඔබටත් දෙවියන්වහන්සේ විසින් කරන්ට විශේෂ වැඩක් භාරදී ඇත. එනම් ස්වාමිවූ යේසුස්වහන්සේ ගැන අන්‍යන්ට සාක්ෂි දැරීමයි. එය සෑම ඇදහිලිවන්තයෙකුගේම වගකීමකි. ඊට අමතරව දෙවියන්වහන්සේ විසින් එක එක ඇදහිලිවන්තයාට විශේෂ දීමනාවක් (හෝ කිහිපයක්) දී තිබේ. යාච්ඤාවෙන් ශුද්ධාත්මයාණන්වහන්සේගේ මග පෙන්වීම ඇතුව ඔබට ලැබී ඇති දීමනාව කුමක්දැයි පැහැදිළි කරගන්න. **"දෙවියන් වහන්සේගෙන් එකිනෙකාට නියමවූ දීමනාවක් ඇත්තේය" (1 කොරින්ති 7:7).**

**"නමුත් ආත්මයාණන්ගේ ප්‍රකාශ වීම එකිනෙකාට දී තිබෙන්නේ ප්‍රයෝජනය පිණිසය " (1 කොරින්ති 12:7).** ගොවියකුට තෑග්ගක් වශයෙන් පැල කිරීමට ගන්නා ධාන්‍ය බීජ ගෝනියක් ලැබුණා යැයි සිතමු. ඔහු එය පෙට්ටියක බහා තබාගෙන ඉන්නේද? නැත. ඔහු ඒවා වපුරා හොඳ අස්වැන්නක් ලබා ගනී. එහි ප්‍රයෝජනය තමාටත් මුළු ලෝකයාටත්ය. ඔබ ලද දීමනාවත් පාවිච්චි කරන්න. එයින් අන් අයගේ ප්‍රයෝජනය සැලසෙනවා මෙන්ම ඔබටත් ආශිර්වාදයක් වේ. එය භාවිතා නොකර පැත්තක තබා සිටියොත් ස්වාමීන්වහන්සේ ඔබ තුළින් එය ඉවත් කරගන්නා සේක.

පාවුල් තුමා සිය මෙහෙය සම්පූර්ණ කළ

බව **2 තිමෝති 4:7** හි සඳහන් කරයි. **"මම දිවීම කෙළවර කළෙමි".** අපගේ ආත්මික ගමන ඇවිදීමක් නොව : දිවීමකි.! දිනුම් පළ කරා දිවීමකි. **"ක්‍රිස්තුස්වහන්සේ තුළ දෙවියන්වහන්සේගේ උතුම් කැඳවීමේ දිනුම් පළ කරා දුවමියි"** පාවුල්තුමා **පිලිප්පි 3:14** හි පවසයි. ඔබෙත් මගෙත් දිවීම මෙයයි. එහි තෑග්ග ධර්මිෂ්ඨකමේ ඔටුන්න වන අතර එය ලැබෙන්නේ ස්වාමින් වහන්සේ ප්‍රකාශවන අවස්ථාවේදීය **(2 තිමෝති 4:8).** තවදුරටත් උන්වහන්සේගේ ප්‍රකාශවීමට ආශාවී සිටින්නාවූ සියල්ලන්ට එම තෑග්ග හිමිවේ (එම පදය) වෙනත් ආකාරයකින් කීවොත් අප අපගේ ආත්මික දිවීමේ ඉලක්කය යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ප්‍රකාශවීමේ ආශාව හා බලාපොරොත්තුවයි. දුවන තැනැත්තාට වටපිටාවේ විසිතුරු නරඹමින් යෑමට කාල වේලාවක් නැත. ඇවිදින තැනැත්තා ලෞකික තෘෂ්ණාවලට ඇලුම් වී ඊළඟට ඔහු නවතිනවා ඇත. එමනිසා පාවුල්තුමා මෙන් අපි පසුපස තිබෙන දේ මතක නැති කොට ඉදිරිය බලා මේ ආත්මික දිවීම නොකඩවා දුවමු.



## පොළොව දෙදරවූ යාච්ඤාව

මෙවැනි යාච්ඤාවක් **ක්‍රියා 16 පරිච්ඡේදයේ** සඳහන් වේ. පාවුල් සහ සීලස් සිරගෙයි දඬුකඳේ ගසා සිටියදී යාච්ඤා කරමින් ස්වාමීන්වහන්සේට ගීතිකා ගායනා කළෝය. එහි ප්‍රතිඵලය වූයේ පොළොව දෙදරුම් කමින්, හිරගෙයි අත්තිවාරම් සෙලවී, සියලු දොරවල් ඇරී බැඳුම් ලිහී යෑම පමණක් නොව ඊටත් වඩා වැදගත් සිදුවීම නම්, ගල් සිතක් ඇති හිරගෙයි මුලාදෑනියාගේ සිත බිඳී ඔහු සහ ගෙදර අය යේසුස්වහන්සේ කෙරෙහි අදහා ගැනීමයි. හදිස්සියේම සිදුවූ මේ සිදුවීමට බලපෑවේ පාවුල් සහ සීලස් යේසුස්වහන්සේව තම ජීවිතයේ කේන්ද්‍රස්ථානයේ තබාගෙන ආත්මික ගමනේ දුවමින් සිටි නිසාය.

**''පොළොවේදී ඔබ ගෞරවයට පැමිණවීමි'' (යොහන් 17:4).** යේසුස්වහන්සේ දෙවිපියාණන් ඉදිරියේ මෙසේ පැවසූ සේක. අපිද යාච්ඤාවෙන් ස්වාමින්වහන්සේට ළඟාවන විට මෙලෙසින් පැවසිය හැකි විය යුතුයි. අපගේ දිනපතා ජීවිතයේදී ආත්මිකව පමණක් නොව සිතෙන්, වචනයෙන්, ක්‍රියාවෙන් දෙවියන්වහන්සේගේ නාමයට ගෞරව පැමිණෙන ආකාර ජීවන රටාවක් පවත්වා ගත යුතුයි. දෙවියන්වහන්සේගේ දරුවෙකු යයි අන් අයට හඳුනා ගැනීමට හැකිවන අයුරින්, යේසුස්වහන්සේගේ ගුණාංග වලින් අප සැරසී සිටිමු. මේ සඳහා ආත්මයාණන්වහන්සේගේ ඵල අපට ඇති හොඳම සැරසිල්ල වේ.

**''නමුත් ආත්මයාණන්වහන්සේගේ ඵල නම්, මේය ප්‍රේමය, ප්‍රීතිය, සමාදානය, ඉවසිලිවන්තකම, කරුණාවන්තකම, යහපත්කම, විශ්වාසකම, මෘදුකම, පමණ දැන ක්‍රියා කිරීම යන මේවාය. මෙබඳු දේට විරුද්ධව ව්‍යවස්ථාවක් නැත''(ගලාති 5: 22-23).**

**''නුඹලාගේ ශරීරයෙන් දෙවියන්වහන්සේට ගෞරව කරපල්ලා'' (කොරින්ති 7:20).**

**''මාගේ පියාණන්වහන්සේට ගෞරව ලැබෙන්නේ නුඹලා විසින් බොහෝ ඵල දැරීමෙන්ය'' (යොහන් 15:8).**

මෙම ගුණාංග නවය ගැන හොඳට මෙනෙහි කරන්න. ජයග්‍රාහික යාච්ඤාවකට අපගේ ජීවිත රටාව හා පැවැත්ම කොපමණ වැදගත් ස්ථානයක් වන්නේ දැයි දැන් ඔබට පැහැදිලි වන්නට ඇත. **යොහාන් 17 : 6** වන පදය මෙසේය **''ඔබ ලෝකයෙන් මට දුන් මනුෂ්‍යයන්ට ඔබගේ නාමය ප්‍රකාශ කළෙමි''** එදා යේසුස්වහන්සේට භාරවූ එම සේවය අද ඔබටත් මටත් භාරව තිබේ. ලෝකයේ මනුෂ්‍යන්ගේ බර අද ඔබෙත් මගෙත් අත්පිට දරන්නට තිබේ. යේසුස් වහන්සේගේ නාමය ප්‍රකාශ කිරීම, තවත් අයුරකින් කීවොත් මහිමාන්විත ශුභාරංචිය ප්‍රකාශ කිරීමේ කාර්යය අප සැමදෙනාටම අයිතිව තිබේ. මේ ලෝකාලෝකය සඟරාව එක සුළු පියවරකි. ඔබ මෙම සඟරාව තුළින් යේසුස්වහන්සේ කෙරෙහි අදහාගත් විට තවත් කෙනෙකුට ශුභාරංචිය පවසන්න. එම පිළිවෙලින් අද ලංකාවේ අපගේ පළාත් සභාවන් පවා බිහිවී තිබේ.

බලන්න යේසුස්වහන්සේ යාච්ඤාවෙන් පියාණන් වෙත ළඟාවන විට පියාණන් වහන්සේගේ කැමැත්ත ඉටුකර තිබේය යන බලවත් නිසැකකමක් එතුමන්ට තිබුණි. අපිත් එම නිසැකකමට ළඟා වෙමු. දවසින් දවස, මොහොතින් මොහොත, එවිට අපගේ යාච්ඤාවන් පර්වත දෙදරවනවා ඇත. තවදුරටත් **''ඔබ මට දුන් වචන ඔවුන්ට දුනිමි''** යි (**8 පදය**) එතුමන් යාච්ඤා කරයි. **''මා එවූ තැනැන්වහන්සේ සත්‍යවාදී කෙනෙක්ය. උන්වහන්සේගෙන් ඇසූදේම මම ලෝකයාට කියමි''(යොහාන් 8:26)** දේව වචනය කියවීමෙන්, දේශනා මගින් සඟරාව හා ශුද්ධ ලියවිලි විස්තරවන පොත් පත් මගින් ශුද්ධාත්මයාණෝ තුළින් දෙවියන්වහන්සේ ඔබට බොහෝ දේ උගන්වන සේක. එම ඉගැන්වීම් සටහන් කර තබාගෙන අන් අය සමඟ බෙදාගන්න. එවිට ඔබටත් පවසන්න පුළුවන්. ''ස්වාමිනී මම ඔබෙන් ඇසූ වචන, ඔබ මට දුන් වචන ඔවුන්ට දුනිමි'' යි කියා. **''ඔවුහු ඒවා (දේව වචනය) පිළිගෙන....... විශ්වාස කළෝය. මම ඔවුන් ගැන යාච්ඤා කරමි'' (යොහන් 17:8)** මේ කොටස ඉතාම වැදගත්ය. යම් කෙනෙකුට ඔබ වචනය දුන්නේද ඔබ ඒ සැමදෙනා ගැන යාච්ඤා කළාද? යේසුස් වහන්සේ එසේ කළ සේක. අපිත් එසේම කරමු. අන් අය ගැන අපේ සිතෙහි තිබෙන බර නිසා, අප ඔවුන් වෙනුවෙන් දණින් සිටිනවා දකින ස්වාමීන්වහන්සේ අපේ අවශ්‍යතාවයන් ගැන යාච්ඤා කිරීමට පෙර දීම ඒවා ඉටුවෙන්නට සලස්වනවා ඇත.

**- ජීවන හඬ -**




# කපුටා

ශුද්ධ බයිබලය මේ කළු පැහැති පක්ෂියා පිළිබඳව අපට පක්ෂියෙකුට වඩා වෙනත් වැදගත් යමක් උගන්වයි. මුලින්ම ශුද්ධ ලියවිල්ලේ ඌ හමුවන්නේ **උත්පත්ති 8:7** හිය.

නෝවා හා ජල ගැලීම පිළිබඳව අලංකාර විස්තරය කියවන විට ජලය බැස යාම පිළිබඳව පිරික්සීමට ප්‍රථමයෙන්ම නෝවා උපයෝගී කරගන්නේ කපුටෙකු බව පෙනේ. ඌ කවුළුවෙන් පිටතට ගොස් ජලය සිඳෙන තුරුම ඔබ මොබ ගියේය. කපුටා තමා යැවූ තැනට යළි හැරී ආවේ නැත. එහෙත් පරෙවියා පිළිබඳව අධ්‍යනයේදී අපි පරවියා නැවෙන් පිටත්ව ගොස් යළි නෝවාගේ අතට හැරී එන අයුරු ඉගෙන ගත් බව ඔබට මතකද? කපුටා මෙන්, ගැලවීම නම් නැවෙන් පිට වී ගොස් මුළුමනින්ම ලෝකයට ආලය වන්නාවුන් කිතුණුවන් අප අතරෙහි විරල නැත. තමා යැවූ තැනැත්තා අතට හැරී ගොස් තොරතුරු දැන්වීම විශ්වාසවත් වැඩකරුවාගේ සේවයයි. එහෙත් පිටත්ව යනවිට තිබූ අරමුණ පසෙක දමා ගිය තැන අලංකාරයට රැවටී ආගමනේ අරමුණ නතර කරන වැඩකරුවා වෘකයෙකි. **උත්පත්ති 8** අපට කියාදෙන මුල්ම පාඩම තම මැවුම්කාර දෙවියන්වහන්සේගේ සුරතින් ගිලිහී පිටවී ගොස් උන්වහන්සේ මෙන්ම හා දේව කැමැත්ත අමතක කරන්නා කපුටා මෙන් ආත්මික කෙරාටිකයෙකු වන බවයි. කපුටා කළුය, අඳුරුය, සාලමොන්ගේ **ගීතිකාවෙහි 5:11** අපට ඌ පිළිබඳව යමක් උගත හැක. උගේ අලංකාර කමක්ද නැත. එහෙත් කපුටාගේ නැති අලංකාරයක් මවා පෙන්වා උගේ හොටෙහි තිබූ කේජු කෑල්ල ඩැහැගත් හිවලෙකු පිළිබද කථාවක් මා බාලාංශයේදී කියවා තිබේ. ආත්මික අන්ධකාරය, කපුටා සංකේතවත් කරයි. දේවවචනය ගැන අන්ධව සිටින නොසැලකිලිමත් අවස්ථාවාදී කිතුණුවන්ටත් සාතන් විසින් මිත්‍යා වර්ණනා උපදවනු ලබයි. ඔවුන් තුළ ඇති සුළු වූ ඉතා සුළු වූ යහගුණයන් පවා සාතන් විසින් උදුරාගනු ලැබීම ඔහුගේ කපටි උපායයි.



**මෙන්න කපුටෝ**

කපුටා කුණු වූ මස්, පලතුරු හා අපවිත්‍ර දෑ අනුභව කරන්නෙකි. ඌ අපවිත්‍ර තැන්වල කිසිදු පැකිලීමකින් තොරව ලගියි. කපුටාගේ මස්කෑම පවා දේව වචනය තහනම් කර තිබේ. පරණ ගිවිසුමේ ආහාර පිළිබඳ නියෝග වල (**ලෙවී කථාවේ 11:16 හා ද්විතීය කථාව 14:14**) එසේ සඳහන් වේ. අයුතු සූරාකන්නන් (**හබකුක් 2:6**) අයුතු ලාභය පස්සේ යන්නන් (**මීකා 2:2, හිතෝපදේශ 19:28**) මත්පැන් පෙරන්නන් (**හබකුක් 2:5**) ඒවා විකුණන්නන් (**හිතෝපදේශ 23:20**) ඒවා පානය කරන්නන් (හිතෝපදේශ 20:1) අපවිත්‍ර දෑ කෙරෙහි ඇස, හිස යොමන්නන්

**(යෙසායා 5:11)** අල්ලස් ගෙන යුක්තිය පෙරලන්නන් **(යෙසායා 5:23)** තමන්ට අයිති නැති දේ හාරා අවුස්සන්නන් **(හිතෝපදේශ 17:9)** නින්දා කරන්නන් **(හිතෝපදේශ 9:8)** මේ කොයි කවුරුත් කපුටාගේ පවුලට නෑකම් කියන්නෝ වෙති. එබඳු අය කිතුණුවන් අතරෙහි සිටිත් නම් ඔවුන් "සුදු කපුටන්" ලෙස නම් කිරීමට මට සිදුවුවොත් අරුමයක් නොවේ. කුණු කෑමට ප්‍රියවෙන කපුටා මෙන් පාපයට ඇලුම්වන්නන් අප අතරද වෙති. කුණු හාරන්නන් මෙන් තමාට අයිති නැති දේ සොයා හාරා ගොඩ දමන්නා වූ කපුටන් කොතෙක් සිටිත්ද? කුණු හාරා කුණු මත ලැග, කුණු ගඳ කුණු වන්නා වූ කොයි කාටත් කපුටා පියෙක් වනු ඇත. සාතන්ගේ මෙන් අවස්ථාවාදී කිතුණුවන් කපුටු ආත්මය දරන අය යැයි කීම නින්දාවක් නොව ඇත්ත ඇති සැටියෙන් පැවසීමකි.



## <u>කපුටු වර්ග දෙක</u>

කපුටාගේ දෙපැත්තක් ශුද්ධ වූ ලියවිල්ල හුවා දක්වයි. එක් පැත්තකින් උගේ දුර්ගුණ හෙළි කරයි. අනෙක් පැතිකඩ උගේ යහගුණ හුවා දක්වයි. **"පියාට නින්දාකරන්නා වූ, මවුට කීකරු වීම සුළු කරන්නා වූ ඇස් (දෙවියන්වහන්සේට නින්දා කරණ සභාව නම් මවුට අකීකරුවන්නා වූ, දේව පිළිවෙළ කඩකරන්නා වූ තැනැත්තා) දෙණියේ කපුටෝ උගුලා ගන්නෝය"** **(හිතෝපදේශ 30:17)**.

කපුටාගේ යහගුණ මුලින්ම හමුවන්නේ (මගේ අදහසේ හැටියට) **1 රාජාවලිය 17:4 හා 6 හිය**. එලියා නම් දේව දාසයාට ආහාර හිඟ නොවන අයුරින් එක් සාගතයකදී ආහාර ගෙන ආවේ කපුටන් විසිනි. ඒ දේව නියමයෙනි. දුර්භික්ෂයේදී ආහාර හා ජලය හිඟ වූ නමුත් දේව වචනය එලියාට මෙසේ පොරොන්දුවක් දෙයි. **"ඒ ඔයෙන් නුඹට බොන්නට පුළුවන. එහිදී නුඹට කෑම දෙන්නට කපුටන්ට අණ කළෙමි'යි කී සේක. ඔහු ගොස් ස්වාමීන්වහන්සේ කී ලෙස කළේය. ඔහු ගොස් යෝර්දාන් ඉදිරිපිට තිබෙන කෙරිත් නම් ඔය ළඟ වාසය කළේය. කපුටෝ උදයේ රොටි සහ මස් ද සවස රොටි සහ මස් ද ගෙනාවෝය."** ඒ සිත් ගන්නා කථාව ඔබම **1 රාජාවලිය 17** න් කියවන්න. කපුටන් යහපත් දේට කීකරු වූ අවස්ථාවක් එසේ සනිටුහන් වෙයි. මෙබඳු අයුරින් අපේ එදිනෙදා අවශ්‍යතාවයන් ස්වර්ගීය පියාණන්වහන්සේ සපයන බවට යළිත් කපුටා උපමා කොට දක්වා තිබේ. ඒ අළුත් ගිවිසුමේය. උපමා කොට ඇත්තේ යේසුස්වහන්සේය. ඒ කොතැනද? කුමන පදයක්ද? ඔබේ බයිබල් දැනීම ඔබටම පුනරීක්ෂණය කර ගැනීමට මම ඉඩ හරිමි. ඒ පදය මේ ලිපිය අගදී ඔබට බලා ගත හැකිය.

**- ප්‍රැන්සිස් විජේසිංහ -**

පැරණි සඟරාවකින් උපුටා ගන්නා ලදී.

# දේව කැමැත්ත



කිතුනුවන් ලෙස අපි සියලු දෙනාගේම ජීවිතය තුළ දෙවියන්වහන්සේගේ කැමැත්ත ඉටුවීම ගැන හා දෙවියන්වහන්සේගේ කැමැත්තට ඉඩදීම ගැන බොහෝ කරුණු කාරණා ගැන දනිමු. මනුෂ්‍යයා ගැන දෙවියන්වහන්සේගේ පොදු සැලැස්ම බයිබලය පුරාවට විස්තර වේ. දෙවියන්වහන්සේට සියලුම යුගයන් වලදී විශ්වය ගැන සැලැස්මක් තිබෙනවා වගේම අපි එකිනෙකාගේ ජීවිත සම්බන්ධවද උන්වහන්සේට සැලසුමක් ඇත. අපගේ ජීවිත සම්බන්ධව දේව කැමැත්ත දැනගැනීමට ශුද්ධාත්මයාණන් වහන්සේගේ මග පෙන්වීම, දේව වචනය හා යාච්ඤාව ප්‍රධාන මාර්ගෝපදේශයන් වේ.

දෙවියන්වහන්සේගේ කැමැත්ත සොයා දැන ගැනීමටත් වඩා දේව කැමැත්ත දැන එය ක්‍රියාවට නැගීම කිතුනුවන්ට අභියෝගයකි. පවුලේ අය, මිතුරන්, ජීවිත තත්වය, රැකියාව, ආදරණීයයන් හා දරුවන් වැනි බොහෝ කරුණු කාරණා හා වගකීම් හේතුවෙන් දෙවියන්වහන්සේගේ කැමැත්ත දැන එය කිරීමට නොහැකි වූ කිතුනුවන් ගැන අපි බොහෝ අසා ඇත්තෙමු. ඔබටත් එවැනි අත්දැකීම් තිබෙනවා ඇති. නැතිනම් දැනටමත් ඔබට එවැනි තෝරා ගැනීමක් කරන්නට තිබෙනවා වෙන්නට පුළුවනි. නමුත් දේව වචනයෙහි ඒ ගැන සඳහන් වන්නේ කුමක්ද?

**"ස්වර්ගයෙහි සිටින මාගේ පියාණන් වහන්සේගේ කැමැත්ත කරන්නා මිස මට ස්වාමීනි, ස්වාමීනි කියන සියල්ලෝම ස්වර්ග රාජ්‍යයට ඇතුල් නොවන්නෝය" (මතෙව් 7:21).**

දේව වචනයෙහි එසේ සඳහන් වන්නේ නම් අපි උන්වහන්සේගේ කැමැත්ත කරන්නට බැඳී සිටිනවා නොවේද? අපි දෙවියන්වහන්සේගේ කැමැත්ත ඉටුකරන්නේ කොහොමද?

- ඔබ කරන්නා වූ දේ සම්බන්ධයෙන් දේව කැමැත්ත සොයා දැනගන්න. දෙවියන්වහන්සේගේ කැමැත්ත කුමක් ද යන්න ශුද්ධාත්මයාණන් වහන්සේ අපගේ හෘද සාක්ෂියට මගපෙන්වයි. උන්වහන්සේ අපට සත්‍ය පෙන්වා දෙන සේක **(යොහාන් 16:13)**.

- දේව වචනය කියවීම, මෙනෙහි කිරීම සහ අධ්‍යයනය තුළ උන්වහන්සේ නිරන්තරයෙන් අපට මග පෙන්වන

බව අපි දනිමු. දිනපතා දේව වචනය පරිශීලනය තුළින් උන්වහන්සේගේ අවවාද, තරවටු සහ සමාදානය අපි ලබමු (**2 තිමෝති 3:14-17**).

● අප ජීවිතවල වාතාවරණයන් සහ තත්වයන් අපව විවිධ මාර්ගයන්ට ගෙන යයි. මෙයින් දෙවියන්වහන්සේ මග පෙන්වන මාර්ගය අප සොයා දැනගත යුතුය. මක්නිසාද ඉදිරිය ගැන දන්නේ උන්වහන්සේය. හෙට දවස අයිති උන්වහන්සේටය. එහි ඉටුවන්නේ උන්වහන්සේ අදහස් කළ දෙය පමණක්මය (**යාකොබ් 4 : 13-17**).

● දේව කැමැත්තට යටත් වීම තුළ උන්වහන්සේගෙන් අපට ගලා එන ආශිර්වාද අති මහත්ය. උන්වහන්සේගේ පූර්ණ කැමැත්ත තුළ අප පමණක් නොව අපගේ දරුවන්ද සුරක්ෂිතය. ආබ්‍රහම්ගේ කීකරුවීම තුළ එසේ සිදුවිය (**උත්පත්ති 17:1-8**). ස්වාමීන්වහන්සේ ඉදිරියෙහි හරිව යහපත්ව තිබෙන දේ කිරීමට සහ උන්වහන්සේගේ මුළු ආඥාව පැවැත්වීමට අපගේ යටත්වීම, අපට ධර්මිෂ්ඨකම වෙයි (**ද්විතීයකතාව 6:17-25**). **"දෙවියන්වහන්සේගේ කැමැත්ත එනම් යහපත් වූ පිළිගත යුතුවූ සම්පූර්ණ වූ දෙය කුමක්ද කියා දැනගන්න"** (**රෝම 12:2**).

● **මතෙව් 25: 14-30** දක්වා සඳහන් තලෙන්ත උපමාව කියවන්න. දෙවියන්වහන්සේගේ කැමැත්ත කිරීම ගැන එහි සඳහන්වේ. දෙවියන්වහන්සේගේ කැමැත්ත කිරීම



සම්බන්ධව යේසුස්වහන්සේ ඉගැන්වූ තවත් එක් උදාහරණයක් නම් **මතෙව් 7 : 21-29** දක්වා සඳහන්ව ඇති අත්තිවාරම් දෙක මත සාදන ලද ගෙවල් ගැන උදාහරණයයි; එහි උන්වහන්සේගේ වචනයට කීකරුවන්නා නුවණැති මනුෂ්‍යයෙක් ලෙසත්, වචනය පිළිනොපදින්නා අඥානයෙකු ලෙසත් උන්වහන්සේ හඳුන්වන සේක.

● දේව කැමැත්ත දැනගත් සහ එයට අවනත වූ බොහෝ පුද්ගලයින් සම්බන්ධ උදාහරණ සහ අවස්ථාවන් බයිබලයෙහි සඳහන් වෙයි. ඒ අතරින් **ක්‍රියා 8:26-40 දක්වා සහ 16:6-10** වූ අලුත් ගිවිසුම් ශුද්ධ ලියවිලි කොටස් කියවන්න.

ප්‍රිය සහෝදර සහෝදරිය දේව කැමැත්ත ඔබේ ජීවිතයේ ඉටුවීම තුළ ඔබ දෙවියන්වහන්සේගේ පූර්ණ කැමැත්තට යටත්ව සිටී, ඒ තුළින් ඔබ උන්වහන්සේගේ පූර්ණ ආශිර්වාද ලද්දෙකි.

දේව කැමැත්ත ඔබ තුළ ඉටුවීමට නම් ඔබ උන්වහන්සේට මුළුමනින්ම භාරවෙන්න. ඔබගේ කැමැත්ත

උන්වහන්සේට භාරදෙන්න. ඔබගේ තීරණ උන්වහන්සේට භාර දෙන්න. ඔබගේ ජීවිතයේ ප්‍රමුඛස්ථානය උන්වහන්සේට දෙන්න. එවිට දාවිත් මෙන් මාගේ **"දෙවියන්වහන්ස ඔබගේ කැමැත්ත කරන්නට ප්‍රිය වෙමි" (ගීතාවලිය 143:10)** යි කීමට ඔබට හැකිවෙයි.

යාච්ඤා කරන්න. දෙවියන්වහනසේගේ කැමැත්ත දැනගැනීම පිණිස යාච්ඤා කරන්න. **"ඔබගේ කැමැත්ත කරන්නට මට ඉගැන්නුව මැනව. මක්නිසාද ඔබ මාගේ දෙවියන්වහන්සේය" (ගීතාවලිය 143:10).** යාච්ඤාව ඔබව දෙවියන්වහන්සේ සමග එක්සිත් කරයි. යාච්ඤාව ඔබට උන්වහන්සේ සමඟ කතා කිරීමට හැකි එකම මාර්ගයයි.

**"මට යාච්ඤා කරන්න එවිට මම නුඹට උත්තර දී නුඹ නොදන්නා මහත් අමාරු දේ නුඹට පෙන්වන්නෙමි" (යෙරමියා 33:3).** ඔබ දේව කැමැත්ත දැන එය ක්‍රියාත්මක කිරීම උදෙසා උන්වහන්සේගෙන් උදව් ඉල්ලා යාච්ඤා කරන්න. **කොලොස්සි 1: 9-11** දක්වා පාවුල් තුමා කළා වූ යාච්ඤාව ඔබගේ යාච්ඤාව කරගන්න.

දෙවියන්වහන්සේගේ විශ්වාසවන්තකම කෙරෙහි විශ්වාස කරන්න. ස්වාමීන්වහන්සේගේ කැමැත්ත කිරීමට ඔබට මගපෙන්වීමට ස්වාමීන්වහන්සේ විශ්වාසවන්තව සිටින බව විශ්වාස කරන්න.

**"ඔබගේ මාර්ගය ස්වාමීන්ට භාර දෙන්න, උන්වහන්සේ කෙරෙහි විශ්වාසයද තබන්න. උන්වහන්සේ එය ඉෂ්ඨ කරන සේක" (ගීතාවලිය 37:5).** දෙවියන්වහන්සේගේ කැමැත්ත දැන එය ක්‍රියාවෙහි යෙදවීම ගැන පිලිප් හොඳ නිදසුනකි. පිලිප්ගේ කීකරුකමෙහි ප්‍රතිඵලයක් වශයෙන් මුළු ජාතියක් කෙරෙහි දෙවියන්වහන්සේගේ ආශිර්වාද ගලා ආවේය. **ක්‍රියා 8:26 - 40** දක්වා කියවන්න.

"දෙවියන්වහන්සේගේ කැමැත්ත එනම් යහපත්වූ පිළිගත යුතු වූ සම්පූර්ණ දේ කුමක්ද කියා දැනගන්න"

දෙවියන්වහන්සේගේ කැමැත්ත දැනගෙන එය කිරීමට වඩා වැදගත් දෙයක් කිතුනු ජීවිතයෙහි නැත. දේව කැමැත්ත ඔබට මග පෙන්වයි. ඔබ කොතැනට යන්නේදැ යි එවිට ඔබ දනී. දේව කැමැත්ත ඔබට අරමුණක් දෙයි. ඔබ ජීවත් වන්නේ කුමක් උදෙසා දැයි එවිට ඔබ දනියි. එය ඔබගේ ජීවිතයට අර්ථයක් දෙයි. දෙවිපියාණන්ගේ පූර්ණ කැමැත්ත ඔබ ජීවිතය තුළ ඉටුවීමට වඩා වෙන වටිනාකමක් කිතුනුවෙකුට නැත. එය ඔබේ ජීවිතයේ ඉටු වේවා යන්න මාගේ යාච්ඤාවයි.

**- ශෂිලා ද සිල්වා -**

# එළිසබෙත්



හිරු නොබසින අධිරාජ්‍යය යැයි විරුදාවලිය ලත් මහා බ්‍රිතාන්‍ය රාජ්‍යයේ එළිසබෙත් රැජින ගැන නොදන්නා කෙනෙක් නැත. අද ඇය සලකනු ලබන්නේ ලෝකයේ සිටි ශ්‍රේෂ්ඨතම කාන්තාව ලෙසටයි. කලක් ඇය ඉතා ගාම්භීර ලෙසත් ප්‍රඥාවන්ත ලෙසත් රටවල් ගණනාවක රැජිණව සිටි කාන්තාවකි. එම මහ රැජිනට එළිසබෙත් යන නම ලැබුනේ කෙසේදැයි ඔබ දන්නේද? ඇයට එම නම ලැබුනේ ශු. බයිබලයේ සඳහන් වන දේව භක්තික ස්ත්‍රියක් වූ එළිසබෙත් නිසාය. එහෙයින් මා දැන් ඔබ ඉදිරියේ දිග හරින්නේ එළිසබෙත් මහ රැජින පිළිබඳ විස්තර නොව ඇගේ නමට හේතු සාධක වූ එම බයිබල් චරිතය පිළිබඳවයි. එම බයිබලීය චරිතය වන එළිසබෙත් ජීවත් වූයේ මීට වසර 2000කට පමණ පෙර පලස්තීන දේශයේය. ඇය අප විසින් දැන ගත යුතු පළමුවෙනි එළිසබෙත් චරිතයයි. ඇගේ කතාව ලියවී තිබෙන්නේ ශු. බයිබලයේ **ලූක් ශුභාරංචි පොතේ 1 වෙනි පරිච්ඡේදයේය.** ඕතොමෝ ඊශ්‍රායෙල් ජාතික කාන්තාවක් වූවාය. තවද ඇය ලෙවී ගෝත්‍රික සෙකරියස් නම් පූජකයාගේ භාර්යාවයි.

එළිසබෙත් යන නමෙහි අරුත "**දෙවියන්වහන්සේ මගේ දිවුරුමයි**" යන්නයි.

මෙම නමේ අරුත ඇගේ ජීවිතයට බලපෑමක් එල්ල කරන්නට ඇති බව පැහැදිලිය. වයස්ගත වන තුරුම දරුවකු නොලැබ සිටි ඇය සමාජ දෝෂ දර්ශනයට ලක්වන විට ඇයට යන්නට තිබුණේ දෙවියන්වහන්සේ අභියසට පමණි. මහළු වීම දක්වාම ඇය අත්දුටුවේ වඳ භාවය, බලාපොරොත්තු සුන්වීම, නින්දාව, සිත් වේදනාව සහ කලකිරීම වැනි අයහපත් දෑ ය. එවන් අත්දැකීම්වලට මුහුණ දෙන විට ඇයට පමණක් නොව අපටද අවශ්‍ය වන්නේ දෙවියන්වහන්සේ තුළ ස්ථිරසාර ඇදහිල්ලයි. දෙවියන්වහන්සේගේ විශේෂිත සැලසුමකට සහ වැඩසටහනකට පංගුකාරියක් වීමට ඇයට අවස්ථාව ලැබුනේ ඒ නොසැලෙන ඇදහිල්ල හේතුවෙනි. ඒ "කවදා හෝ මට දෙවියන්වහන්සේ දරුවකු ලබා දෙනු ඇත"යි විශ්වාස කළ ඇදහිල්ල නොව දෙවියන්වහන්සේගේ ස්වාධිපත්‍යයට යටත්වීමෙත්, දෙවියන්වහන්සේ සැමවිටම යහපත් බව විශ්වාස කිරීමේත් ඇදහිල්ලයි. මෙය අපට කදිම පාඩමකි. බොහෝ විට අප ඇදහිල්ල දකින්නේ අපට වුවමනා දේ දෙවියන්වහන්සේගෙන් ලබාගැනීමේ උපක්‍රමයක් ලෙසයි. එහෙත් වඩා වටිනා ඇදහිල්ල නම් අප පතන දේ නොලැබී ගිය විටද දෙවියන්වහන්සේගේ යහපත්භාවය සැක නොකිරීමයි. එළිසබෙත් චරිතය හරහා අප උගත යුතු ප්‍රමුඛ පාඩම එයයි. ශුද්ධ බයිබලයේ ඇදහිල්ල විග්‍රහ කරන සැබෑ ඇදහිල්ලට ආදර්ශ සපයන **හෙබ්‍රෙව් 11 වන පරිච්ඡේදයේ 33** වන පදයේ මෙසේ ලියා ඇත. **"මොවුන් සියල්ලෝ ස්වකීය ඇදහිල්ල කරණකොට ගෙන සාක්ෂිය ලැබත් පොරොන්දු වී තිබුණු දෙය නොලැබුවෝය".**

'වඳී' ලෙස එළිසබෙත්ගේ අසල්වාසීන් හා නෑදෑයින් ඇයට පටබැඳ තිබූ නම ගැන **ලූක් 1:36** පදයේ සඳහන් ව ඇත. ඒ ඇයට දරු ඵල නොතිබීම හේතුවෙනි. එවැනි තත්වයක් නින්දාවක් ලෙස සලකන සමාජයක දෙවියන්වහන්සේ ඇයව තබා තිබූ නමුත් තම අසාර්ථකත්වය පිළිබඳව දෙවියන්වහන්සේට දොස් තබනවා වෙනුවට උන්වහන්සේගේ යහපත්භාවය පිළිබඳව විශ්වාසය තබා ජීවත්වන්නට ඇයට හැකි විය. ඇගේ ජීවිතයෙන් අප උගත යුතු ප්‍රධාන පාඩම මෙයයි. **"දෙවියන්වහන්සේ වෙත ළඟාවෙන්නා විසින් උන්වහන්සේ විද්‍යාමාන බවත් උන්වහන්සේ සොයන්නන්ට විපාක දෙන කෙනෙකු බවත් විශ්වාස කරන්ට ඕනෑය" (හෙබ්‍රෙව් 11:6).** අප ඇදහිලිවන්ත ජීවිතයේ නින්දා අපහාස වලට ගොදුරු වන්නේ ප්‍රධාන කොට අප ක්‍රිස්තුස්වහන්සේ අදහාගෙන සිටීම නිසායි. කිතුනු නොවන අසල්වාසීන් හෝ නෑයින් විසින් අපගේ ධර්මිෂ්ඨ ජීවිතය නිසාම අපට වෙනස්කම් කොට නින්දා අපහාස පවා කරන්නට ඉඩ තිබේ. එවැනි අත්දැකීම් ලබන කල **1 පේතෘස් 4:17** හි සඳහන් දේ හොඳින් සිහියේ තබා ගනිමු. **"ක්‍රිස්තුස්වහන්සේගේ නාමය නිසා නින්දා කරනු ලබන්නහු නම් නුඹලා ආශිර්වාද ලද්දහුය. මක්නිසාද මහිමයේ ආත්මයාණන්වහන්සේ වන දෙවියන්වහන්සේගේ ආත්මයාණන් නුඹලා කෙරෙහි රඳන සේක."**

ශාරීරික වඳ භාවය ලැජ්ජාවට කරුණක් වූවාක් මෙන්ම වර්තමානයේ ආත්මික වඳභාවය අපට නින්දාවක් ගෙන දෙයි. අපගේම වර්ගයා බෝ කිරීමේ එනම් අප මෙන් තවත් ඇදහිලිවතුන් බිහිකිරීමෙහි ලා නොහැකියාවක් සහ උදාසීන බවක් අපගේ ජීවිත වල පෙනෙන්නට තිබේ. ශුභාරංචිය බෙදාගැනීමට සහ සාක්ෂි දැරීමට අප තුළ උනන්දුවක් නොමැති වීම අපගේ ආත්මික වඳභාවයේ ප්‍රධාන හේතුවයි.



**තම පරම්පරාවට ආශිර්වාදය ගෙනා එළිසබෙත්**

දෙවියන්වහන්සේ ඇයට පුතෙකු ලබා දීමේ කතාව **ලූක් 1:15-26, 40-45 ද 56-64 දක්වාද** කියවන්න. ස්ත්‍රීන්ගෙන් උපන් තැනැත්තන් අතරින් උතුම්ම මිනිසා යැයි යේසුස්වහන්සේ විසින් ප්‍රකාශ කළ **(මතෙව් 11:9)** යොහාන් බව්තීස්ත මෙලොවට බිහිකිරීමේ මහඟු අවස්ථාව එළිසබෙත්ට හිමි විය. මෙසේ ඇය දෙවියන්වහන්සේගේ විශේෂ සැලසුමක් තුළට ඇතුල් වූවාය. දහස් ගණනක් මිනිසුන් තම පාප වලින් පසුතැවිල්ලට පමුණුවන්නට හැකියාව ලැබූ යොහාන් බව්තීස්තගේ මව වී ඈ තම පරම්පරාවට මහත් ආශිර්වාදයක් ගෙන ආවාය. "වඳී" යැයි නම් කරනු ලැබූවත් ඇගේ ජීවිතයේ අවසාන ප්‍රතිඵලය වූයේ මිනිසුන් දෙවියන්වහන්සේට වඳින්නට පෙළඹවීමයි. යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළ ඇදහිලිවන්තයන් වන අපගේ ජීවිත වලද සමස්ත ප්‍රතිඵලය එළිසබෙත්ගේ මෙන් වූවොත් කොපමණ අගේද? ඈට දෙවියන්වහන්සේ දුන් පුත්‍රයා පිළිබඳව ඇයට ලෞකික අභිලාෂයන් නොතිබුණු බවට බයිබලය සාක්ෂි දරයි. **ලූක් 1:80-** දරුවා වැඩී ආත්මයෙන් ශක්තිමත් ව ඊශ්‍රායෙල්ට තමා ප්‍රකාශ වන දවස දක්වා වනාන්තර ස්ථාන වල සිටියේය. වර්තමාන මවක් සාමාන්‍යයෙන් කරනුයේ තම පුතා පිළිගත් අධ්‍යාපන ආයතනයකට

යවා උසස් තනතුරක වැජඹෙන පුද්ගලයෙකු බවට පත් කරවීමයි. එහෙත් එළිසබෙත් විසින් කර තිබුණේ තම පුතා දෙවියන්වහන්සේගේ අභිප්‍රාය ඉටුකරලීමට සූදානම් කරවීමයි. තවත් එවැනි ශ්‍රේෂ්ඨ මව් චරිතයක් **1 සාමුවෙල්** පොතෙහි අපට හමු වේ. ඇය නම්, තම පුතු වන සාමුවෙල් දේව සේවයට කැප කිරීමට කැමති වූ හන්නා ය.

අලුත් ගිවිසුමේ පළමු වතාවට ශුද්ධාත්මයෙන් පූර්ණ වූ බවට ශුද්ධ බයිබලයේ සඳහන්ව ඇත්තේ එළිසබෙත් පිළිබඳවයි. **"එවිට එළිසබෙත් ශුද්ධාත්මයෙන් පූර්ණ ව මහත් ශබ්දයකින් හඬ නගා කියන්නේ..........**" යන ලෙස **ලූක් 1:41 සහ 42** හි සඳහන්ව තිබේ. මෙය එළිසබෙත් පිළිබඳව සුවිශේෂී කරුණක් නොවන්නේද? යේසුස්වහන්සේගේ ප්‍රමුඛ පෙළේ ගෝලයන් වන පේතෘස් සහ යොහාන් ද, තවත් බොහෝ ඇදහිලිවතුන් ද ශුද්ධ ආත්මයාණන්ගෙන් පූර්ණ වූ අයුරු පසුව අලුත් ගිවිසුමෙහි සඳහන්ව තිබේ. එහෙත් එළිසබෙත් එම අත්දැකීම ලැබූ පළමුවැන්නා වීම මහත් වරප්‍රසාදයක් නොවන්නේද? ශුද්ධාත්මයාණන්ගෙන් ඇදහිලිවන්තයෙකු පූර්ණ වීම සහ ඉන් අත්වන ප්‍රතිඵල පිළිබඳ වර්තමාන කිතුනුවාට ඇත්තේ අවුල් සහගත අවබෝධයකි. එනිසා ඇගෙන් අපට උගත හැකි දේ තවත් විශාලව පෙනේ. ශුද්ධාත්ම පූර්ණකම ලැබීමෙන් ඇයට ලැබුනේ කුමක්ද? ඇය ශුද්ධාත්මයෙන් පූර්ණ වූ අවස්ථාවේ ඇය බැහැදකින්නට යේසුස්වහන්සේ තම කුස තුළ පිළිසිඳ සිටි මරියා පැමිණ සිටියාය. ඇය අමතා ශුද්ධාත්මයෙන් පූර්ණ වූ එළිසබෙත් කියා සිටියේ මෙයයි. **"නුඹ ස්ත්‍රීන් අතරෙහි ආශිර්වාද ලද්දීය. නුඹේ ගර්භයේ ඵලයද ආශිර්වාද ලද්දේය. මාගේ ස්වාමීන්වහන්සේගේ මෑණියන් මා ළගට පැමිණීම කෙසේ සිද්ධ වීද?"** බලන්න දිව්‍ය සැලසුම ගැන ඇයට තිබුණු එළිදරව් වීමේ ප්‍රමාණය ගැන. **"මාගේ ස්වාමීන්වහන්සේගේ මෑණියන්"** යැයි මරියාට ආමන්ත්‍රණය කරන්නට තරම් ඇයට දිව්‍ය ප්‍රඥාව ලැබී තිබුණාය. යේසුස්වහන්සේගේ අනන්‍යතාවය මුලින්ම නිවැරදිව වටහා ගැනීමේ ගෞරවයද මෙලෙස ඇයට හිමි වේ. එවකට යේසුස්වහන්සේගේ අනන්‍යතාවය කිසිවෙකු දැන සිටියේ නැත. ශුද්ධාත්මයාණන්වහන්සේ අප තුළ වැඩ සිටීම කරණකොටගෙන අපට ලැබෙන ප්‍රධාන ආශිර්වාදයක් නම් මළවුන්ගෙන් නැවත නැගිටි යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සැබෑ අනන්‍යතාවය දැනගන්නට ලැබීමයි. කරුණාකර **යොහාන් 16:14** කියවන්න. **"උන්වහන්සේ මා ගෞරවයට පමුණුවන සේක. මක්නිසාද උන්වහන්සේ (ශුද්ධාත්මයාණන්වහන්සේ) මා සන්තක දෙයින් රැගෙන නුඹලාට ප්‍රකාශ කරන සේකැ"යි** යේසුස්වහන්සේම පැවසූ සේක. එළිසබෙත්ගේ ජීවිතයෙහි ශුද්ධාත්මයාණන්ගේ ක්‍රියා කිරීමේ ප්‍රතිඵල ගැන තවත් කරුණු උගත හැකි නමුදු දැනට මෙතැනින් නවතින්නෙමි.

ඉහත සැකෙවින් සඳහන් කරන ලද එළිසබෙත් පිළිබඳ වූ කරුණු තුන යළි මෙනෙහි කරන්නට ඔබට ඇරයුම් කරමි. අපගේ ජීවිත තුළ එළිසබෙත්ගේ චරිතය යළි ජීවත් කරවන්නට ඔබට සහ මට හැකි වේවා !

**- ඈන් ජයසුන්දර -**

# කිතුනු දිවියට අත්වැලක්



අද අපි යාකොබ් පොතෙහි තුන්වන පරිච්ඡේදය දෙස බලමු. **(යාකොබ් 3)** අප බොහෝ දෙනාට මතක පරිදි එම පරිච්ඡේදයේ සඳහන් වන්නේ දිව පාලනය කිරීම පිළිබඳවයි.

● දිව නිවැරදිව හැසිරීම පිළිබඳව අප අසමත් ව සිටින බව බයිබලය පවසයි. **(යාකොබ් 3 : 8)**

දිව දමනය කිරීම මනුෂ්‍යයාට කළ නොහැකි දෙයක් බව දෙවියන්වහන්සේ පවසා ඇති විට එය සත්‍යලෙසම කිසි මනුෂ්‍යයෙකුට කළ නොහැකිය.

**රෝම 3:23** ට අනුව සියල්ලෝම පව් කොට තිබේ යැයි දෙවියන්වහන්සේ පවසන විට එක් පුද්ගලයෙක් හෝ අත් නොහැර සියල්ලෝම පව්කරුවන් බව තේරුම් ගත යුතුය. තමන්ගේ දිව දමනය කළ නොහැකි මනුෂ්‍යයා අනිත් මිනිසුන්ට දිව පාලනය කිරීම පිළිබඳ දේශනා කිරීම අද පවතින විශාල ගැටළුවකි. මෙම විෂය පිළබඳ දේව වචනය විමසා බලමු.

**යාකොබ් 3:1-12** ශුද්ධාත්මයාණන් වහන්සේ විසින් ඉතා සැර සහ අන්තවාදී උදාහරණ මඟින් මෙම කරුණ අපගේ හදවත් වලට ඇතුලත් කිරීමට උත්සුක වේ. මෙම ප්‍රකාශය අවසානයේ දෙවියන්වහන්සේගේ ආත්මයාණෝ අපගේ ගැලවීම සමඟ මෙය ගැට ගසති. **(යාකොබ් 3 : 12)** පදය යේසුස්වහන්සේ අපට කී වචනයට එනම් **මතෙව් 7:16-18** ට අපගේ මතකය ගෙන යයි. එසේම මෙය අපගේ අද දවසේ කතාබහ සමඟ ගැළපේ. අපේ කතා ව්‍යවහාරය හොඳ නම් අපි හොඳ ගසක් බවත් මෙයින් අපට පැහැදිලි වේ. ඇදහිලිවන්තයන් ලෙස මේ පිළිබඳව අප සැලකිලිමත් විය යුතුය.

## දිව පිළිබඳ ජනවහරයේ ඇති අදහස්

● දිව හොඳ සේවකයෙකි.

● නරක ස්වාමියෙකි.

● දිව දෙකේ මිනිසෙකි.

කිසිවෙකුට දිව දමනය කළ නොහැකි බව පවසයි නම් අපි කුමක් කරමුද? බයිබලයෙහි සියල්ලෝම පව් කොට තිබේ යැයි පැවසූ පසුත් පාපයෙන් ජය ගැනීම පිළිබඳව බයිබලය අපට ගුරුහරුකම් ලබා දේ. එලෙසම දිව දමනය කළ නොහැකි බව දෙවියන්වහන්සේ පැවසූවත් අලුත් ඉපදීමක් කරණකොටගෙන දෙවියන්වහන්සේගේ දරුවන්ව සිටින නිසා අපි අන්‍යයන්ගෙන්, ලෝකයෙන් වෙනස් විය යුතුය. **"කිසි මනුෂ්‍යයෙකුට දිව දමනය කරන්නට බැරිය. එහෙත් එය දෙවියන්වහන්සේට යටත් කළ හැකිය."**

දෙවියන්වහන්සේගේ දරුවකු ලෙස අපට ඇති එකම විසඳුම මෙයයි. එය අපට **රෝම 6:13** ට අනුව බයිබලය පෙන්වා දේ. නිරායාසයෙන්ම දිව වැරදි ලෙස භාවිතය යන පාපයෙන් ගැලවීමට නොහැක. දිව දෙවියන්වහන්සේට කැප කිරීම/යටත් කිරීම කළ යුතු වේ. සංකීර්ණ සහ විශාල විෂයක් වන මෙම දිව පිළිබඳව බයිබලයේ බොහෝ ස්ථාන වල සඳහන් වේ.

- නපුරු දිව
- වංචාකාර දිව
- බොරුකාර දිව

මේ පිළිබඳව බොහෝ බයිබල් පද ඇති අතර එමඟින් අප උගත යුතුය. දිව පිළිබඳ සෘණාත්මක පැතිකඩ පමණක් නොව ධනාත්මක පැතිකඩ පිළිබඳව ද අප අවධානය යොමු කළ යුතුය. **හිතෝපදේශ 18:21** හි අර්ථය දිවෙන් කාව හෝ මරන්නටත්, ජීවනය දීමටත් හැකි බවය.

මේ අවුරුද්ද තුළ ඔබගේ දිවෙන් ඔබ මිනිසුන් කී දෙනෙක් මරණයට පත් කරාද? ඉදිරියට මරණයට පත්කරන්නට යනවාද? එලෙසම දැනටම මරණයට පත් ව සිටින කී දෙනෙක්ට අලුත් ජීවනය දුන්නාද? කී දෙනෙක්ට ජීවනය දීමට යනවාද? අපි මෙහි සෘණාත්මක පැතිකඩ පිළිබඳව ද සිතමු. අපේ වචන හරහා මරණයට පත් නොකිරීමට නොව මැරී සිටින්නවුන්ට ජීවනය දීමටද අප උත්සුක විය යුතුය.

## දිව පිළිබඳ සඳහන් බයිබල් පද කිහිපයක්

- **ගීතාවලිය 57:4, ගීතාවලිය 52:2** - දිව තියුණු කඩුවක්ය.

මෙය පුද්ගලයාගේ චරිතය පිළිබඳ කියමනකි. දිව නොව පුද්ගලයා මෙහිදී චූදිතයා වේ. අපගේ දිව තියුණු කඩුවකට මෙන්ම දැලි පිහියකට සමාන වේ.

- **යාකොබ් 3:6** දිව ගින්නක් ය. එයට ගිනි ඇවිල එන්නේ නිරයෙන් බවත් එම පදයේ සඳහන් වේ. එනම් නිරයේ ගින්න අපගේ දිවෙන් අපි දරාගෙන යන බවත් ය. මීට වඩා තවත් නපුරු වූ දෙයක් ගැන සිතිය හැකිද? මීට වඩා විනාශකාරී වූ තවත් දෙයක් ඇත්ද?

- **යෙරෙමියා 9:8** දිව විදින ලද ඊතලයක් මෙන් ය. මෙම ඊතලය තුවාලයක් සිදු කිරීමට යවන්නා වූ දෙයකි. දිව දැනටම ඊතලයකි.

- **යාකොබ් 3:6** දිව නපුරේ ලෝකයක්ය.

- **යාකොබ් 3:8** පාලනය කළ නොහැකි නපුරක්, වස වලින් පිරි නපුරක්ය.

- **ගීතාවලිය 52:4, ගීතාවලිය 109:2** දිව වංචා සහගත ය.

- **යාකොබ් 3:8** දිව දමනය කල නොහැකිය.


මෙය දිවෙහි සෘණාත්මක පැතිකඩ වේ. නමුත් දිවට ජීවනයක් දීමට පුළුවන. අපේ දිව අන්‍යයන්ට ජීවනය දීමට පමණක් පාවිච්චි කරමු.

**- ජීවන හඬ -**

# මහත් වූ අත්දැකීමක් ද වරප්‍රසාදයක් ද වගකීමක් ද වූ අති ශුද්ධස්ථානය

හෙබ්‍රෙව් පොතෙහි බොහෝ අවස්ථා වල පරණ ගිවිසුමට අනුකූල වූ නමස්කාරය හා වර්තමාන අපගේ නමස්කාරය සමඟ සංසන්දනයන් දැක ගත හැකිය. **(හෙබ්‍රෙව් 10:19 - 22)** දක්වා කොටස කියවා බැලූ විට **ලෙවී කතාව 16** වැනි පරිච්ඡේදය හා සම්බන්ධ කිරීමක් , සිහි කිරීමක් වේ. අලුත් ගිවිසුම් ලියවිලි කියවන විට එය එම ස්ථානයට පමණක්ම අනුකූල නොවන බවත්, පරණ ගිවිසුම් ලියවිලි හා සම්බන්ධ බවත් මතක තබා ගත යුතුය. මන්ද මෙහි කතෘතුමන් එකම පුද්ගලයෙකු බවත් ඒ දෙවියන් වහන්සේගේ ආත්මයාණන්වහන්සේ බවත් ඇදහිලිවන්තයන් අතර ප්‍රාථමික කරුණකි. **(හෙබ්‍රෙව් 10:20)** පදයෙහි දෙවියන්වහන්සේගේ ශුද්ධාස්ථානයට ඇතුල්වීමේ නිර්භීතකම නොහොත් නිදහස ගැන සඳහන් වේ.

පරණ ගිවිසුමෙහි කාන්තාරයෙහි පිහිටෙවූ මණ්ඩපයෙදී හෝ දේව මාලිගාවේදී හෝ අද අපට ඇති එම නිර්භීතකමක් හෝ නිදහසක් නොතිබුණු එවකට පැවති අතිශුද්ධස්ථානය ඉතා ගන තිරයකින් වසා කිසි පුද්ගලයෙකුට ඇතුල් වීමට නොහැකි වනලෙස අතිශුද්ධස්ථානය වෙන් කර තිබුණි. මෙම කියමන දැනගෙන අද අපි **(හෙබ්‍රෙව් 10:19,20)** කියවන විට මෙහි ඇති වෙනස සහ එහි ඇති අපූර්වභාවය අපගේ දෙනෙතට පෙනී සිතට අවබෝධ විය යුතුය. **(ලෙවී කතාව 16:2)** පරිදි නිතර අතිශුද්ධස්ථානයට ඇතුළු නොවන ලෙස දෙවියන්වහන්සේ ආරොන්ට අණ



කරයි. මන්ද එවකට එය දෙවියන්වහන්සේ ප්‍රකාශ වන ස්ථානය බැවින්ය. නමුත් පසුව අවුරුද්දකට වරක් පමණක් උත්තම පූජකයාට අතිශුද්ධස්ථානයට ළඟා විය හැකි බව **(ලෙවී කථාව 23:27)** සඳහන් වේ. එම දවසේ කළ යුතු දේ දෙවියන්වහන්සේගේ කරුණාසනයේ අභිමුඛයට ඇතුල්වීම සීමා කරනු ලැබූ ස්ථානයක් බවට සඳහන් වේ. පරණ ගිවිසුම් යුගයේදී නමස්කාර කලා වූ අයට සත්‍ය වශයෙන්ම දෙවියන්වහන්සේගේ අභිමුඛයට පැමිණ නමස්කාර කළ බව පැවසීමට ඉඩක් නැත. එයට උදාහරණයක් වශයෙන් නික්මයාම පොතෙහි **"ඉශ්‍රායෙල් හි වැඩිමහල්ලෝ දුර සිට නමස්කාර කළෝය"** යන වාක්‍ය සඳහන් වේ. අද අප **(හෙබ්‍රෙව් 10:19,20)** පදය කියවන විට එම වෙනස දැක අප හදවත් ප්‍රීතිඝෝෂා නැගිය යුතුය. එලෙසම **(හෙබ්‍රෙව් 10:19,20)** අනුව අලුත් වූ ජීවමාන වූ මාර්ගයකින් ශුද්ධස්ථානයට නොහොත් අතිශුද්ධස්ථානයට ඇතුළු වීමේ නිදහස යේසුස්වහන්සේගේ ලේ කරණකොට ගෙන අපට තිබේ.

මේ නිසා අද අපි කරන්නා වූ නමස්කාරයෙහි

තිබෙන බරපතළකම තේරුම් ගැනීමට සහ අගය කිරීමට උත්සුක විය යුතුය. එම නමස්කාරය අද අප කණ්ඩායමක් ලෙස පමණක් නොව තනි පුද්ගලයන් ලෙස ද දෙවියන්වහන්සේගේ අභිමුඛයට ළඟා වේ. එම දෙවියන්වහන්සේගේ අතිශුද්ධස්ථානයට ඇතුළු වීමේ නිදහස අප සතුව ඇත. එම ශුද්ධස්ථානය අද ගොඩනැගිල්ලක් නොව අපි ඇදහිල්ලෙන් ඇතුල්වන්නා වූ ස්වර්ග යේ දෙවියන්වහන්සේගේ අභිමුඛය ඇති ස්ථානයයි. මෙහි සඳහන් වන සාධක දෙක මත අපි එම ස්ථානයට ළඟා විය යුතුය.

යේසුස්වහන්සේ තමන්ගේම ලේ සහිතව අතිශුද්ධස්ථානයට ගිය නිසා අපට එම නිර්භීතකම ඇති බව **(හෙබ්‍රෙව් 10:12)** යේසුස්වහන්සේ පූජාවක් ඔප්පු කර දෙවියන්වහන්සේගේ දකුණු පාර්ශ්වයේ වැඩ සිටින බව ද සඳහන් වේ. මෙම කොටසට අදාළ තවත් පද ලෙස **(හෙබ්‍රෙව් 9:12)** සම්බන්ධ කළ හැකිය. මේ නිසා යේසුස්වහන්සේ තුළ දෙවියන්වහන්සේගේ අභිමුඛයට ඇතුළු වීමේ නිර්භීතකම අපට හිමි වේ. එය දෙවියන්වහන්සේගේ මහිමාන්විත, භයානක, ශුද්ධ වූ අභිමුඛයයි. පරණ ගිවිසුම් යුගයේ යම් පුද්ගලයෙක් එම නීතිරීති වලට පටහැනි ව ශුද්ධස්ථානයට ඇතුළු වූ විට ක්ෂණිකව මරණයට පත් වේ. අද අප සැමදෙනාටම ඇදහිල්ලෙන් ඇතුළු වීමේ අවස්ථාව ඇත.

දෙවියන්වහන්සේගේ ගෘහය කෙරෙහි අපට උතුම් වූ පූජකයෙක් සිටින බැවින් **(හෙබ්‍රෙව් 10:21)** අපට එම නිර්භීතකම ඇති බව පෙනේ. අප සියලු දෙනා දෙවියන්වහන්සේගේ අභිමුඛයට ඇතුල් වන විට ඇති පදමට මෙම උත්තම පූජකයාණන්ගේ මෙහෙය සිහි කරමින් අගය කළ යුතුය. මෙය ආත්මික ව්‍යායාමයක් හා වැදගත් කරුණකි. පියාණන්වහන්සේගේ දකුණු පාර්ශ්වයෙහි වැඩ සිටින අපගේ උත්තම පූජකයා වෙතට අපගේ හදවතේ සත්‍ය ස්වරූපයෙන් ළඟා විය හැකිය. අප අපවම සෝදිසි කොට යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ශුද්ධ වූ රුධිරය අප හදවත් වල ඉසිනු ලැබූ බව අමතක නොකළ යුතු කරුණකි. අපි වෙනුවට මැදිහත්කම් කරන උත්තම පූජකයා වන යේසුස් වහන්සේගේ මෙහෙය අපි අගය කළ යුතුය. ස්වාමී වූ යේසුස් වහන්සේ අපට ශුද්ධස්ථානයට ඇතුල් වීමට දොර ඇර දුන් නිසා මේ මොහොතේ පියාණන්වහන්සේගේ දකුණු පාර්ශ්වයේ සිට අප වෙනුවෙන් මැදිහත්කම් කරන නිසාත් අප නිදහස් ආත්මයකින් අතිශුද්ධස්ථානයට ළඟා වෙන්නෙමු ව පරණ ගිවිසුම් යුගයේදී එවකට තනි පුද්ගලයෙක් දෙවියන්වහන්සේගේ ශුද්ධස්ථානයට ළඟා වුවත් අද අපට ඇදහිලිවන්ත සෑම දෙනාටම එක විට දෙවියන්වහන්සේගේ ශුද්ධස්ථානයට ළඟා වීමේ වරප්‍රසාදය හිමි ව ඇත. මෙය අපට මහත් වූ අත්දැකීමක් ද මහත් වූ වරප්‍රසාදයක්ද, මහත් වූ වගකීමක් ද වී තිබේ.

**- දේශනාවක් ඇසුරෙනි -**

**සකස්කලේ - අමන්දි**

# ගීතාවලිය 84

මෙම ගීතිකාව ඉතා ප්‍රීතිමත් ගීතිකාවකි. නමස්කාරය පිළිබඳ සඳහන් වන ගීතයකි. අපගේ නමස්කාරයේ ඉලක්කය පිළිබඳව නිසැකකමින් සිටිය යුතු බව මෙම ගීතිකාවේ ගීතිකාකරුවන් අපට උගන්වයි. අපි නමස්කාර කරන්නේ කාටද? අප අවට සෑමදෙනාම කුමක් හෝ දෙයකට නමස්කාර කරන බව නොරහසකි. අපගේ නමස්කාරයේ ඉලක්කය වැරදි වූ විට නමස්කාරය ව්‍යාජ බවට පත්වේ.

මෙම ගීතිකාව තුළ ගීතිකාකරුවා සිව් වතාවක් දෙවියන්වහන්සේ සර්වබලධාරී දෙවිවූ ස්වාමින්වහන්සේ ලෙස හඳුන්වයි. එනම් (**84:1/84:3/84:8/84:12**)

★ **84:2** උන්වහන්සේ ජීවමාන දෙවියන්වහන්සේ ය.

★ **84:11** උන්වහන්සේ දෙවි වූ ස්වාමින් වහන්සේ ය.

උන්වහන්සේ තම ජනතාව සමඟ ගිවිසුමක සිටින බව කියාපාන දෙවියන්වහන්සේගේ ගිවිසුම්ගත නාමයයි.

★ **84:8** යාකොබ්ගේ දෙවියන්වහන්සේ මනුෂ්‍යයන්ව රූප මාරුවකට වෙනස් කරන්නා වූ දෙවියන්වහන්සේය.

★ **84:3** දෙවියන්වහන්සේ මාගේ දෙවියන්වහන්සේය. මාගේ රජ්ජුරුවන් වහන්සේය.

මෙම ගීතිකා කරුවා තවත් ස්ථාන වල දෙවියන්වහන්සේ මාගේ එඬේරාය, දෙවියන්වහන්සේ මාගේ ආලෝකය ය, උන්වහන්සේ මාගේ ගැලවුම්කාරයාණෝ යැයි සඳහන් කර ඇත. මෙම ප්‍රකාශන මඟින් අපි දෙවියන්වහන්සේව දැන හැඳින ගෙන , නමස්කාර කිරීමට භාවිතා කරයි.

මෙම **ගීතාවලිය 84:11,12** පද වල සඳහන් වන දෙවියන්වහන්සේ දෙන්නා වූ පොරොන්දු 6 ක් විමසා බලන්නට ඔබට ඇරයුම් කරමි.

**01. දෙවියන්වහන්සේ අපේ සූර්යයා ය.**

සූර්යයාගෙන් අපට ලැබිය හැකි ලාභ ප්‍රයෝජන අතර ආලෝකය ප්‍රමුඛ වේ. එලෙසම දෙවියන්වහන්සේ අපේ ආලෝකයයි. උන්වහන්සේ අපගේ හදවත් ආලෝකමත් කරන අතර අපට මඟ පෙන්වයි.

● තවත් ලාභ ප්‍රයෝජනයක් ලෙස වර්ධනය වීම සඳහා සූර්යයා අත්‍යාවශ්‍ය සාධකයකි. සූර්යයා නොමැති ව කිසිම පැළයක් වර්ධනය නොවේ. එලෙසම දෙවියන්වහන්සේ අප ජීවිත වල සූර්යයා මෙන් වර්ධනය වීමට ද ඵල දැරීමට ද අප තුළ ක්‍රියා කරයි.

● සූර්යයාට සුවකිරීමේ හැකියාවක් ද

පවතී. හිරු ආලෝකයෙන් විටමින් D නිපදවන බව අප දන්නා කරුණකි.

එලෙසම දෙවියන්වහන්සේ සූර්යයා ලෙස අප සුව කරන තැනැන්වහන්සේ ය. **මලාකී 4:2 , නික්මයාම 15:26** මෙයට බයිබලීය උදාහරණ වේ. එය ශාරීරික සුවය, මානසික සුවය, ආත්මීය සුවය, හැඟීම් සම්බන්ධ සුවය, සම්බන්ධතා වල ඇති සුවය සියල්ල හිමි වේ.

## 02. ස්වාමීන්වහන්සේ අපගේ පලිහයි.

උන්වහන්සේ අපව ආරක්ෂා කරන තැනැන්වහන්සේ ය. පලිහක් නොමැතිව යුද්ධයකට සහභාගී නොවේ. එලෙස අපට ලෝකයට විරුද්ධව, මාංශයට විරුද්ධව, සාතන්ට විරුද්ධව සටනක් තිබේ. එම නිසා දෙවියන්වහන්සේ අපට ඇදහිල්ල නැමැති පලිහ උරුම කර දී තිබේ. අප වෙත එල්ල වන සියළු යක්ෂයාගේ ගිනිමය හෙල්ලයන් එම පලිහ මඟින් නිවාදැමිය හැකිය.

## 03. දෙවියන්වහන්සේ අපට අනුග්‍රහය දී තිබේ.

උන්වහන්සේ සියළු අනුග්‍රහයේ දෙවියන්වහන්සේය. එදිනෙදා දවසට ඔබට සෑහෙන අනුග්‍රහය දෙවියන්වහන්සේ දී තිබේ. මෙය නිම නොවෙන, අවසන් නොවෙන අනුග්‍රහයකි.

● අපව උසුලාගනු ලබන, දරා ගන්නා වූ අනුග්‍රහය - ගිනිමය සෝදිසිකිරීම් වලදී අපව ආරක්ෂා කර, ඉදිරියට ගෙනයයි.

● දෙවියන්වහන්සේගේ, වළක්වන අනුග්‍රහය - පාපයෙන් අපව වළක්වයි. පරීක්ෂාවෙන් අපව වළක්වයි. කතා කරන වචන පිළිබඳවත් මෙම වළක්වන අනුග්‍රහය අපට අවශ්‍ය වේ. අපි කෙතරම් අප ජීවිත වලදී පැවසූ වචන ගැන පසු තැවී තිබේද? එය ස්වාමිපුරුෂයා සහ භාර්යාව සම්බන්ධතාවයේදී කෙතරම් බලපෑමක් ඇති කරයි ද? දෙමාපිය දරුවන් අතර සම්බන්ධතාවයේදී කෙතරම් සිත රිදෙන වචන දෙමාපියන් දරුවන්ට පවසයිද? දරුවන් දෙමාපියන්ට පවසයිද?



## 04. දෙවියන්වහන්සේ මහිමය දෙන සේක.

මහිමය නම් ගෞරවය යි. දෙවියන්වහන්සේගේ යහපත් කාලය තුළ උන්වහන්සේ අපව මහිමයට පත් කරනු ඇත. නුමුත් එම කාලය තෙක් අප ඉවසිල්ලෙන් සිටිය යුතුය. අපගේ වගකීම නම් දෙවියන්වහන්සේට ගරු

කිරීමයි. උන්වහන්සේගේ වගකීම අපව ගෞරවයට පත් කිරීමයි. **ගීතාවලිය 91:15** මෙයට උදාහරණ වේ.

## 05. සැපයීම නැමැති පොරොන්දුව

මෙය හරියට හිස් බැංකු චෙක්පතක් දෙවියන්වහන්සේ අපට දී තිබේ. උන්වහන්සේගේ අත්සන එහි සඳහන් වන අතර අපට අවශ්‍ය මුදල ලියා ගත හැකිය. අවංකව හැසිරෙන්නන්ගෙන් උන්වහන්සේ කිසි යහපතක් නොවළක්වයි. **ගීතාවලිය 34:10, ගීතාවලිය 85:12** අපට උපකාර වන දේවල් පමණක්ම දෙවියන්වහන්සේ අපට ලබා දේ.

## 06. උන්වහන්සේව විශ්වාස කරන තැනැත්තා ආශිර්වාද ලද්දේය.

මෙහි ආශිර්වාදය නම් බහුල වූ, උතුරා ගලා යන ප්‍රීතියයි. මෙහි පද 2යි. පොරොන්දු 6කි. නමුත් කොන්දේසි 2කි. මෙම පොරොන්දු කොන්දේසි 2ක් මත රැඳා පවතී.

### 01. අවංක ලෙස හැසිරෙන්නන් (84:11)

අපි සියලු දෙනා මනුෂ්‍යයෝය. සෑම දවසකම අපි අසමත් වේ. දෙවියන්වහන්සේගේ අනුග්‍රහයෙන් කැළලක් නැති ජීවිතයක් ගත කිරීමට අප උත්සාහ කළ යුතුය. වෙනත් පුද්ගලයෙකුට අප ජීවිත දෙසට ඇඟිල්ලක් දිගු කිරීමට ඉඩ නොතැබිය යුතුය. ඔබව වැඩිපුරම සෝදිසි වන්නා වූ ස්ථානය ඔබේ නිවසයි. (**ගීතාවලිය 101:2**) අප සභාව තුළදී වෙස්මුහුණක් සහිතව රඟපෑමට දක්ෂයි. නුමුත් නිවසේදී එය එසේ නොවේ.

### 02. ස්වාමීන් කෙරෙහි විශ්වාස කරන මනුෂ්‍යයා ආශිර්වාද ලද්දේය.

ඔබේ ජීවිතයේ ඍණාත්මක වාතාවරණයන්, ජීවිතයේ කුමක් සිදුවෙනවාදැයි නොතේරෙන විට පවා දෙවියන්වහන්සේ කෙරෙහි තබා තිබෙන නොසෙල්වෙන විශ්වාසය උදාහරණයක් ලෙස යෝබ් - "උන්වහන්සේ මාව මැරුවත් මම උන්වහන්සේ කෙරෙහි විශ්වාස කරමි." ජීවිතවල කටුකභාවය අධික වූ විට දෙවියන්වහන්සේව අත්හැරි පුද්ගලයන් ඔබත් දැක ඇත. එම අමාරු අත්දැකීම් තුළදී අපි හොඳින් වර්ධනය වේ. දෙමාපියන් තුළ ඇති ප්‍රබලතම වේදනාව නම් දෙවියන්වහන්සේගෙන් වෙන් ව ගමන් කරන්නා වූ දරුවන් ය. එම අකීකරු දරුවන් ව ප්‍රතික්ෂේප නොකර ප්‍රේම කරන්න සහ නිරාහාරව සිට යාච්ඤා කරන්න. අප වැටුණු පාපකාරී ලෝකයක ජීවත් වේ. අපව නිතර සෝදිසියට ලක් වේ. නුමුත් නොබිඳෙන විශ්වාසය අපව දෙවියන්වහන්සේගේ ආශිර්වාසය කෙරෙහි ගෙනයයි.

- බෙන්ජමින් දේවදාසන් සහෝදරයාගේ දේශනාවක් ඇසුරිනි -

**සකස් කලේ - අමන්දි**

# කවුද ලොක්කා !



මුළුතැන් ගේ ඇතුලේ ලොකු සංවාදයක් කුස්සියේ වැඩකරන කාණ්ඩය එකතු වෙලා වාද කරගන්නව, කාගෙන්ද වැඩියෙන්ම ලොකු සේවයක් වෙන්නේ කියලා.

“මම තමයි මෙතන ප්‍රධානියා. කවුද මම නැත්නම් හාල්ටික සුද්ද කරලා දෙන්නේ.” ඒ කිව්වේ කුල්ල එතකොට මෙන්න නෑඹිලිය මැදට ඇවිත් කියනවා “ඔහේ හාල් සුද්ද කළාට ගල් ඉවත්කරන්න බෑනේ . මම නැත්නම් මේ ගෙදර අයගේ දත්ටික ඉවරයි.” මෙන්න හට්ටිය ඉදිරියට ඇවිල්ලා, “නවත්තගන්නවලා පුර සාරම, මම නැත්නම් බත ඉදෙන්නේ කොහෙද? මට වැඩිය ප්‍රධානියා කව්ද” ඒ කතාවට හරස් කපමින් කතා කළා මිරිස්ගල “ඔහේල හිතුවා මදි. බත් කියලා නිකන්ම කන්න පුළුවන්ද ? මගෙන් කෙරෙන හරිය කියන්න ඕනෙනෑනෙ. මම තමයි ප්‍රධානියා” ඒ ගමන මිරිස්ගල උඩම අත්ගල හිටගත්ත. “මේ ඔහේට අමතක වුණාද නිකම්ම මිරිස් ඇඹරෙන්නේ නැතිවග. මමයි ඒවා ගානට අඹරන්නෙ. ඒ හන්ද මෙතන ලොක්කා මමයි” පෙරලි පෙරලි මේ එන්නෙ වංගෙඩිය. “මේ ගෙදර මිනිස්සු හැමදාම බතුයි හොදි කනව යි කියල හිතුවද? ආප්ප ඉඳිආප්ප කෑම ජාති නැතුව පුළුවන්ද? ලොකු උත්සව වලට කෑම හදන්න මාව ඕනෑ. ඒ හන්ද මටත් ලොකු තත්වයක් තියෙනවා” මෝල්ගහට කේන්ති ගියා. “ඔහේ හාල්ටික ගිලගත්තයි කියල නිකම්ම පිටිවෙනවාද? මගෙ වටිනාකම කියන්න ඕනෙ නැහැනේ” වාදය දිගටම යනවා. අන්තිමට කතා කළේ ලුණු පොල්කට්ට “ඔක්කොම රහට කාලා ඉවරයි මම නැතිනම්, මමයි ලොක්කා” ගෙදර කාන්තාව මේ ඔක්කොම අහගෙන “නිශ්ශබ්ද වෙනවා, පණ්ඩිතකම කීවට ඔහේලා ඔක්කොම මම නැත්නම් තිබ්බ තැන්

වල නේද? ඔහේලා ඔක්කොගේම උප -කාරය මට එක වගේම වැදගත්. එක් කෙනාට වෙනම සේවයක් තිබුණාට රස කෑම වේලක් හදන්න ඔක්කොමල පංගුකාර වෙනවා. ඒ හන්ද එක් එක් කෙනාට වැඩිය උසස් වෙන්න හිතන් නැතුව , සමාදානෙන් වැඩ කරන්න ඕනෑ" කියා කාන්තාව කීවා. වාදය නිමවුණා.

මේ ලස්සන කතාවෙන් පුංචි ඔබට විතරක් නොවේ. ඔයාලගෙ වැඩිහිටි යන්ටත් ඉගෙන ගන්න ලෙකු ආත්මික පාඩමක් තියෙනවා. දෙවියන්වහන්සේට අපි ඔක්කොමල එක වගේ වැදගත්. පාර පවිත්‍ර කරන සේවක මහතාගෙන් , රටේ ජන නායක තුමාගේත් සේවය එක හා සමාන වැදගත්. පුංචි කාලේ ඉඳලම මේ ටික හිතට ගෙන, ඔක්කොමලා එක වගේ, බේද නැතුව සමාදානෙන් වැඩකරන්න හිතට ගන්න. එවිට පමණයි යේසුස්වහන්සේට ගෞරවය ලැබෙන්නේ, අපි කුමන තත්වයක, කුමන සේවයක සිටියත් යේසුස් වහන්සේට අපව එක වගේ වටිනවා. **"ගෞරවයෙන් තම තමාට වඩා අනිත් අය උතුම් කොට සලකාපල්ලා"(රෝම 12: 10).**

මේ ආකාරයට දෙවියන්වහන්සේ අපි හැමටම එක එක හැකියාවන් දී තිබෙනවා. ඒ දෙවියන්වහන්සේ සේවය නොහොත් උන්වහන්සේගේ සභාව ගොඩනැගීම උදෙසා. 1 කොරින්ති 12 පරිච්ඡේදය කියවා බලන්න. අප අපගේ ආත්මාර්ථකාමි සිතුවිලි වලින් මිදී අපම දෙවියන්වහන්සේගෙන් ලැබූ දීමනා හෝ සේවයන් අනුව අනිත් කෙනාට තිබෙන දීමනාවට ගෞරව කරමින් ස්වාමීන්වහන්සේගේ සේවයේ නිරත වෙමු.

**- ගුරු හරු -**

# දිනපතා ආත්මික ව්‍යායාම

★ දිනපතා බයිබලය කියවන්න.

★ දිනපතා වේලාවක් වෙන් කරගෙන යාච්ඤා කරන්න.

★ දිනපතා දෙවියන්වහන්සේට ස්තූති, ප්‍රශංසා, නමස්කාර කරන්න. (නිවසේදී)

★ සෑම ඉරුදිනකම සභාවට යන්න.

★ ඔබගේ ආදායමෙන් දෙවියන්වහන්සේගේ කොටස වෙන් කර පූජා කරන්න.

★ සෑම විටම අන් අයට යහපත් ක්‍රියාවන් කරන්න.

★ සෑම විටම සුභාරංචිය තව කෙනෙකුට සරලව පවසන්න.


www.christianfellowshipcentre.com

Cfc Colombo (Christian Fellowship Centre)

CFC Colombo

**ක්‍රිස්තියානි සහෝදර මධ්‍යස්ථානය**
අංක - 07, විවේකානන්ද පාර,
වැල්ලවත්ත,
කොළඹ 06.
දුරකථන අංක : 011 2 581 901 / 077 8 813 197

www.christianfellowshipcentre.com


NMA GRAPHICS
No. 246/1, Galle Road, Ratmalana.
Tel: 011 2 730 644 / 071 4 286 295 / 077 4 223 020
E-mail : nmagraphics2001@gmail.com